# ප්‍රසම්පාදන දැන්වීම

## ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

CFHC

### දික්ඕවිට ධීවර වරායේ (උතුරු පර්යන්තයේ) බෝට්ටු යාත්‍රාංගනයේ කාපට් ඇතිරීම
### (Asphalt paving of boat repair yard at Dikkowita Fishery Harbour - North Terminal)

### ප්‍රසම්පාදන අංකය : (CFHC/PD/AP-BRY/DICK(N)/2026-28)

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් **දික්ඕවිට ධීවර වරායේ (උතුරු පර්යන්තයේ) බෝට්ටු යාත්‍රාංගනයේ කාපට් ඇතිරීම** සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් **ජාතික තරගකාරී ලංසු ක්‍රමය** යටතේ මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. අදාළ විස්තර පහත දක්වා ඇත.

| අනු අංකය | විස්තරය සහ ප්‍රසම්පාදන අංකය | ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම සහ කොන්ත්‍රාත් කාලය | යෝග්‍යතා අවශ්‍යතා | ලංසු සුරක්ෂණයේ වටිනාකම | ලංසු වලංගු කාලය | ආපසු නොගෙවනු ලබන තැන්පතු මුදල |
|---|---|---|---|---|---|---|
| 01 | දික්ඕවිට ධීවර වරායේ (උතුරු පර්යන්තයේ) බෝට්ටු යාත්‍රාංගනයේ කාපට් ඇතිරීම **ප්‍රසම්පාදන අංකය :** (CFHC/PD/AP-BRY/DICK(N)/ 2026-28) | **රුපියල් මිලියන 17.23** (වැට් බදු සහ අනපේක්ෂිත වියදම් රහිතව) කොන්ත්‍රාත් කාලය - **කැලැන්ඩර් දින 60 කි.** | CIDA Grade - C6 හෝ ඉහළ (C6 or above) - මාර්ග ඉදිකිරීම් සඳහා (Road Construction) | වටිනාකම රු.215,000.00 කි. දී ඇති ආකෘතියට අනුව ලංසු සුරක්ෂණයේ වලංගු කාලය 2026.08.06 | ලංසු භාර ගන්නා අවසාන දින සිට 2026.07.09 දින දක්වා වලංගු විය යුතුය. | රු. 5,000.00 |

මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන් හෝ නම් කළ නියෝජිතයින් සඳහා **2026.03.30 දින සිට 2026.04.23 දින දක්වා** රාජකාරී දිනයන් හි **පෙ.ව. 9.00 සිට ප.ව 3.00 දක්වා ප්‍රධාන කාර්යාලයෙන් හෝ වරාය කළමනාකාර (දික්ඕවිට - උතුරු පර්යන්තය)** වෙත ලිඛිත ඉල්ලීමක් කිරීමෙන් හා ආපසු නොගෙවනු ලබන **රු.5,000.00 ක** ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ප්‍රසම්පාදන ලේඛනය ලබා ගත හැකිය.

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 08 වන වගන්තියට අනුව පොදු කොන්ත්‍රාත් ලේඛනය මගින් නිකුත් කරන සහතිකය (ලංසු වටිනාකම රුපියල් මිලියන 05 ට වැඩි වන අවස්ථාවල දී) ලබා දිය යුතුය.

ලංසු සුරක්ෂණය, ආපසු හැරවිය නොහැකි සහ ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සිදු කරන පළමු ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් කළ හැකි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබා ගත යුතු අතර **සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක.15, රොක්හවුස් පටුමග, කොළඹ 15** නමට නිකුත් කළ යුතුය. ලංසු සුරක්ෂණය, මුදල් තැන්පතුවක් (ශ්‍රී ලංකා රුපියල්) ලෙස ද ගෙවීම් කළ හැකි අතර ප්‍රධාන කාර්යාලයේ හෝ දික්ඕවිට ධීවර වරායේ (උතුරු පර්යන්තයේ) **මුදල් අයකැමි වෙත** ගෙවා මුදල් රිසිට් පතෙහි මුල් පිටපත ලංසුව සමග අමුණා තිබිය යුතුය.

**ප්‍රධාන කාර්යාලය හෝ දික්ඕවිට ධීවර වරාය (උතුරු පර්යන්තය)** යන ස්ථානවල දී අදාළ ප්‍රසම්පාදන ලේඛනය මිලදී ගැනීමට ප්‍රථම නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ප්‍රසම්පාදන ලේඛන පිටපත් දෙකකින් මුල් පිටපත සහ අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර තනි කවරයකට බහා ඉදිරිපත් කළ යුතුය.

මේ සම්බන්ධයෙන් පූර්ව ලංසු රැස්වීම **2026.04.09 දින පෙ.ව. 10.30 ට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පළමු මහලේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ දී** පැවැත්වේ.

නියමිත පරිදි අත්සන් කොට නිල රබර් මුද්‍රාව යොදා ප්‍රසම්පාදන ලේඛනය ලිපි කවරයක ඇතුළත් කොට එහි වම් කෙළවරේ අදාළ කොන්ත්‍රාත්තුවේ නම, ලංසු භාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් කර **2026.04.24 දින පෙ.ව.11.00 ට හෝ ඊට ප්‍රථම** ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථා ප්‍රධාන කාර්යාලයේ දෙවන මහලේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ හැකිය.

විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ලේඛනය **2026.04.24 දින පෙ.ව. 11.00 පසු වූ වහාම ප්‍රසම්පාදන අංශයේ දී** ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ දී විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ප්‍රසම්පාදන ලේඛන ප්‍රතික්ෂේප කරන අතර විවෘත කිරීමකින් තොරව ආපසු භාර දෙනු ලැබේ. අදාළ ප්‍රසම්පාදන ලේඛන පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් වශයෙන් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු 0112 529 391 හෝ 0112 525 063 වෙතින් ලබා ගත හැකිය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,**
**අංක.15, රොක්හවුස් පටුමග,**
**කොළඹ 15.**

SELACINE

Scanned with CamScanner